A3 - 04   A4 - 1

90

සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - කොළඹ අධ්‍යාපන කලාපය
மேல் மாகாணக் கல்வித் திணைக்களம் - கொழும்பு கல்வி வலயம்
Western Provincial Education Department - Colombo Educational Zone

දෙවන වාර ඇගයීම - 2016
இரண்டாம் தவணை மதிப்பீடு - 2016
**Second Term Evaluation - 2016**

| | | |
|---|---|---|
| 11ශ්‍රේණිය<br>தரம் 11<br>Grade 11 | **සංගීතය (පෙරදිග) 1 පත්‍රය**<br>**Music (Oriental) Paper 1** | *පැය එකයි*<br>*ஒரு மணித்தியாலம்*<br>*One Hour* |

සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

1) |ග්‍රප්‍ර ධනි ස්නි ධප | මග මරි සරි ස-| මෙසේ යෙදෙනුයේ
   I. යමන් රාගයට අයත් සර්ගම් ගීතයේ ස්ථායි කොටසය.
   II. භූපාලි රාගයට අයත් මධ්‍යලය ගීතයේ ස්ථායි කොටසය.
   III. කාෆි රාගයට අයත් තානාලංකාරයකි .
   IV. බිලාවල් රාගයට අයත් තානාලංකාරයකි .

2) සරිගරිස ,සරිගපගරිස,සරිගපධපගරිස,සරිගපධස,ධපගරිස ආදී වශයෙන් ගොඩ නැගෙන්නේ
   I. බිලාවල් රාගයේ ස්වර අභ්‍යාසයකි
   II. කාෆි රාගයේ ස්වර අභ්‍යාසයකි
   III. භූපාලි රාගයේ ස්වර අභ්‍යාසයකි
   IV. යමන් රාගයේ ස්වර අභ්‍යාසයකි

3) නිර්දේශිත රාග අතරින් ම,ස වාදී සංවාදී වන සම්පූර්ණ ජාති රාගය වනුයේ
   I. බිලාවල්   II.භෛරවී   III.කාෆි   IV.භූපාලි

4) සුළු මැදුම් දෙතිතට සමාන වන හින්දුස්ථානි තාලය වනුයේ
   I.ඛෙම්ටෝ තාලය   II.දීප්චන්දි තාලය
   III.ජප් තාලය   IV.ත්‍රිතාලය

5) ශ්‍රී ලංකාවේ ජාතික ගීයේ නිර්මාතෘවරයා
   I. සුනිල් ශාන්ත ශූරීන්ය.
   II. ඩබ්ලිව්.ඩී. අමරදේව ශූරීන්ය.
   III. එච්.ඩබ්.රූපසිංහ ශූරීන්ය.
   IV. ආනන්ද සමරකෝන් ශූරීන්ය.

6) |ස-රිස |රි-ගරි |ග-මග |ප-ප-| යනුවෙන්ආරම්භ වන ස්වර ස්ථාපන ගීයේ අවසාන ස්වර පාදය වනුයේ
   I. |ම- පම |ප- ධප |ධ- නිධ |ස- ස-|
   II. |සනිධප |ධ- ප- |ධපමග |ප- ම-|
   III. |ග- මග |ම- පම |ප- ධප |සනිධප|
   IV. |ගරිසනි |ධනිසරි|පමගරි |ස- ස-|

- පහත සඳහන් වගුවේ නිර්දේශිත රාග වලට අයත් සර්ගම් වල ස්ථායි කොටසෙහි ස්වර ඇතුලත් වේ.එම වගුව ආශ්‍රයෙන් අංක 7 සිට 11 තෙක් ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

<table>
<tr><td>A</td><td>| ගපධනි | ස̇-ධප | මගමරි | සරිස- |</td></tr>
<tr><td>B</td><td>| ස̇ස̇ධප | ගරිසරි | ග- පග | ධපග- |</td></tr>
<tr><td>C</td><td>| නිධම | පගුරි | සරිගු | මප- |</td></tr>
<tr><td>D</td><td>| නිධ-ප|ම්පගම්|ප --- | පම්ගරි |</td></tr>
<tr><td>E</td><td>| සධුපධු |මපගුම|නිධු-ස | -රිගුම |</td></tr>
</table>

7) "සපිරුණු රතියේ සුගැයෙන උදයේ" යනුවෙන් ගැයෙන ලක්ෂණ ගීතයට සම්බන්ධ රාගයේ සර්ගම් ගී පාදය ඇතුළත් තීරුව වන්නේ

I. A ය II.C ය III.D ය IV.B ය

8) B තීරුවේ ස්වර පාදය අයත් රාගය කුමක්ද?

I. කාෆි රාගය II.භූපාලි රාගය. III.භෛරවී රාගය IV.යමන් රාගය

9) D තීරුවට ඇතුලත් සර්ගම් පාදය අයත් රාගයේ

I. ප,ස ස්වර වාදී සංවාදී වේ

II. රි,ප ස්වර වාදී සංවාදී වේ

III. ග,නි ස්වර වාදී සංවාදී වේ

V. ධ,ග ස්වර වාදී සංවාදී වේ

10) E තීරුවට ඇතුලත් ස්වර පාදයට අයත් සර්ගම් ගීතයේ අන්තරා ආරම්භ වන්නේ

I. | පපධනි | ස̇-ස̇- | ධනිස̇රි̇ | ස̇නිධප |

II. | පධම | පධනි | ස̇රි̇ගු̇ | රි̇ස̇- |

III. | ගගපධ |පස̇-ස̇ | නිරි̇ග̇රි̇ | ස̇නිධප |

IV. | නිසගුම | ධුමධු නි | ස̇-ස̇- | ගු̇ගු̇රි̇ස̇ |

11) C තීරුවට අයත් සර්ගම් පාදය ගැයෙන තාලය වන්නෝ

I. ජප් තාලය II.දාදරා තාලය III.දීප් චන්දි තාලය IV.ත්‍රිතාලය

- පහත සඳහන් පුද්ගලයින් ඇසුරෙන් අංක 12 සිට 16 තෙක් ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

A-පණ්ඩිත් අමරදේව
B-ජග් ජීත් සිං
C-උස්තාද් ශකිර් හුසේන්
D-මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍ර මහතා
E-රවින්ද්‍රනාත් තාගෝර් තුමා

12) ගසල් ගායන ශෛලියට ප්‍රසිද්ධ වූ සංගීතවේදියා දැක්වෙන නිවැරදි ඉංග්‍රීසි අක්ෂරය වන්නේ

I. A II. B III. C IV. E

13) මාල දිවයින් ජාතික ගීයේ තනු නිර්මාණය කල සංගීතඥයා දැක්වෙන අක්ෂරය

I. A    II. C    III. D    IV. E

14) නව නාට්‍ය සම්ප්‍රදාය ශ්‍රී ලංකාවේ ප්‍රචලිත කිරීමට පුරෝගාමී වූ පුද්ගලයෙකි.

I. A    II.B    III.E    IV.D

15) තබ්ලා වාදනය සම්බන්ධයෙන් ප්‍රසිද්ධියට පත් වූ සංගීතඥයා දැක්වෙන අක්ෂරය

I. A    II.C    III.D    IV.E

16)වංග සංගීතය ප්‍රචලිත කිරීමට පුරෝගාමී වූ සහ ඉන්දියානු ජාතික ගීයේ නිර්මාතෘ වරයා දැක්වෙන නිවැරදි ඉංග්‍රීසි අක්ෂරය වන්නේ

I. A    II.B    III.E    IV.D

17)අනාසාතාත්මක ජන ගී වර්ගයට උදාහරණයක් ලෙස දැක්විය හැක්කේ

I. නෙලුම් ගී    III. පැල් ගී
II. කෙලි ගී    IV. ගොයම් ගී

18) නාඩගම් සංගීතය සඳහා අභාෂය ලබා ගෙන ඇත්තේ

I. කපිරිඤ්ඤා සංගීතයෙනි    III. දක්ෂිණ භාරතීය සංගීතයෙනි
II. උත්තර භාරතීය සංගීතයෙනි    IV. ජන සංගීතයෙනි

19) සබරගමු වන්නමක කොටස් දැක්වෙනුයේ මෙසේය.

I. දවුල් පදය,බෙර පදය,කවිය,දොහොරාව,අඩව්ව
II. දවුල් පදය,තානම,ස්ථායි,අන්තරා,අඩව්ව
III. දවුල් පදය,උරුට්ටුව,තානම,කවිය,අඩව්ව,
IV. දවුල් පදය,තානම,කවිය,කලාසම,අඩව්ව

20) සබරගමු හා උඩරට නර්තන සම්ප්‍රදායන්ට අයත් ප්‍රධාන අවනද්ධ භාණ්ඩ වන්නේ පිලිවෙලින්

I. ගැට බෙරය හා දවුල    III. මද්දලය හා ගැට බෙරය
II. දවුල හා ගැට බෙරය    IV. දවුල හා යක් බෙරය

- අංක 21 සිට 23 තෙක් ප්‍රශ්න වලට පහත සඳහන් පැදිය ඇසුරෙන් පිළිතුරු සපයන්න

සදවා සුදු වැලි පිවිතුරු
බඳවා රන් දද පියකරු
සිටුවා දොර දොර රඹ තුරු
තබවා පුන් කුඹු විසිතුරු

21) මෙම පැදිය ඇතුලත් වන්නේ

I. ගුත්තිල කාව්‍යයේය    III. හංස සංදේශයේය
II. සැළලිහිණි සංදේශයේය    IV. කාව්‍ය ශේකරයේය

22) මෙම පැදිය ප්‍රබන්ධ කර ඇත්තේ

I. සොළොස්මත් විරිතටය    III. දොළොස්මත් විරිතටය
II. සමුද්‍ර ඝෝෂ විරිතටය    IV. අටවිසිමත් විරිතටය

23)මෙම පැදියේ සැදැස්මත් ගණන හා ගීමත් ගණන වන්නේ

I. සැදැසමත් 12 කි.ගීමත් 12කි
II. සැදැසමත් 12 කි.ගීමත් 16කි
III. සැදැසමත් 18 කි.ගීමත් 22කි
IV. සැදැසමත් 12 කි.ගීමත් 24කි

24) තිත් රූප දෙකකට ගැයෙන සබරගමු වන්නමකි

I. කෝකිල වන්නම
II. තිසරා වන්නම
III. විරාඩි වන්නම
IV. කදම්බි පක්ෂි වන්නම

25)"සත් සියක් කපු මල් රැගෙන මම " යන ගීය

I. නරි බෑනා නාට්‍යයේ එන ගීයකි
II. කර්දිය මුද්‍රා නාට්‍යයේ එන ගීයකි
III. මනමේ නාට්‍යයේ එන ගීයකි
IV. කුවේණි නාට්‍යයේ එන ගීයකි

26) භෛරවී රාගය ආශ්‍රිත සරල ගීයක් <u>නොවන්නේ</u>

I. කවාලා විළඳ ජාතී
II. එන්න මද නලේ
III. කළිඳු ගංගා දෙනියේ
IV. ගුමු ගුමුව වදුලේ

27)දෙවොල් මඩු ශාන්ති කර්මය අයත් වන්නේ

I. පහත රට සම්ප්‍රදායටය
II. උඩරට සම්ප්‍රදායටය
III. සබරගමුසම්ප්‍රදායටය
IV. නාඩගම්සම්ප්‍රදායටය

28) අවසාන කාලයේදී ශ්‍රවණාබාධිත තත්වයට පත්වූ එරෝයිකා ,පැස්ටරෝල් ඇතුළු සිම්ෆනි 9ක් නිර්මාණය කල සංගීතඥයෙකි.

I. මෝසාර්ට්
II. බිතෝවන්
III. ෆ්‍රැන්සිස් ෂුබර්ට්
IV. යානි

29) F මයිනර් කෝඩ්(F minor chord) එකට අයත් වන්නේ කුමන ස්වරද

I. ම <u>නි</u> රි
II. ම ධ ස
III. ම <u>ධ</u> ස
IV. ම ප ස

30) |ග ස ග |ප- -| ම ම ධ |ප- -| යන ස්වර පාදයේ Bar 4 ට වඩාත්ම ගැලපෙන chords පිලිවෙලින්

I. CGFC
II. CFGC
III. CCFG
IV. FCGC

31)|ස ස ස රි |ග - - - |ම ම ම ග |රි - - -| යන ස්වර පාදයට වඩාත්ම ගැලපෙන harmony ස්වර පාදය වන්නේ

I. |ග ග ග ම |ප- - -|ධ ධ ධ ප |ම - - -|
II. |රි රි රි ග |ම - - - |නි නි නි ධ|ප- - -|
III. |ස ස ස රි|ග - - -|ම ම ම ග |රි - - -|
IV. |ධ ධ ධ ප|ම -- -|රි රි රි ග |රි -- -|

32)"සංධ්වනියකදී " වයලින් ,වියෝලා ,වෙලෝ,ඩබල්බේස් යන සංගීත භාණ්ඩ අයත් වන්නේ

I. brasswind වර්ගයටය
II. percussion වර්ගයට
III. woodwind වර්ගයටය
IV. string වර්ගයටය

33) නුර්ති රංග සම්ප්‍රදායේ සංගීත නිර්මාණය සඳහා පසුබිම් වී ඇත්තේ

I. හින්දුස්ථානි සංගීතය
II. කර්ණාටක සංගීතය
III. වංග සංගීතය
IV. බටහිර සංගීතය

34)පසත්,තිර්ලානා ,වඩිමුඩි ,තංගපාට ආදී තාල පද නාඩගම් සම්ප්‍රදායේ භාවිත වේ.ඒවා වාදනය සඳහා සුදුසු වාද්‍ය භාණ්ඩය වන්නේ

I. තවිල්
II. මද්දලය
III. සටම්
IV. මෘදංගම්

35)|සැ දැ s | කළුවර |කුරගු|ගා s චිත්| යන සරල ගී ගායනයට සුදුසු තාලය වන්නේ

I. ජප් තාලය
II. දිප්චන්දී තාලය
III. ත්‍රි තාලය
IV. දාදරා තාලය

36) |+ ඉර ව ඹ බ ලා|ඉ ර මු|දු නේ s | මෙම ගීතය ආරම්භ වන්නේ

I. සමග්‍රහයෙන්ය
II. අවග්‍රහයෙන්ය
III. විෂමග්‍රහයෙන්ය
IV. සූර්යග්‍රහයෙන්ය

37)"හරි ප්‍රසාද් චෞරසියා දක්ෂ ඉන්දියානු සංගීතඥකි."මොහු වඩාත් ප්‍රසිද්ධියට පත්ව ඇත්තේ

I. වයලින් වාදනය සඳහාය
II. සන්තූර් වාදනය සඳහාය
III. සිතාර් වාදනය සඳහාය
IV. බටනලා වාදනය සඳහාය

38) මධ්‍ය සප්තකය හා උච්ච සප්තකය අතර පිළිඹිබු වන ප්‍රධාන වෙනස නාදයේ කුමන ගුණයද?

I. තාරතාවය
II. විපුලතාවය
III. ධ්වනි ගුණය
IV. රූප භේදය

39) සෑම චරිතයකටම වෙස් මුහුණු පැළඳවීමේ ලක්ෂණය දක්නට ලැබෙන නාට්‍ය සම්ප්‍රදාය

I. නාඩගම්
II. කෝලම්
III. නූර්ති
IV. නව නාට්‍ය

40) නූතන ලෝකයේ symphony orchestra සඳහා ප්‍රචලිත ඉතාලි ජාතික සංගීතඥයෙකි.

I. බිතෝවන්
II. මෝසාර්ට්
III. යානි
IV. ෆ්‍රැන්සිස් ෂූ බර්ට්

සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - කොළඹ අධ්‍යාපන කලාපය
மேல் மாகாணக் கல்வித் திணைக்களம் - கொழும்பு கல்வி வலயம்
Western Provincial Education Department - Colombo Educational Zone

දෙවන වාර ඇගයීම - 2016
இரண்டாம் தவணை மதிப்பீடு - 2016
**Second Term Evaluation - 2016**

| | | |
|---|---|---|
| 11ශ්‍රේණිය<br>தரம் 11<br>Grade 11 | සංගීතය (පෙරදිග)IIපත්‍රය<br>சங்கீதம் (கீழைத் தேய)வினாத்தாள்-11<br>Music (Oriental) Paper II | පැය දෙකයි<br>இரண்டு மணித்தியாலங்கள்<br>Two Hours |

**පළමුවන ප්‍රශ්නය ඇතුලුව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.**


01.)**(i) සිට (iv) තෙක් ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.**

(i) බිලාවල් රාගයෙහි මුඛ්‍යාංගය ලියා දක්වන්න.
(ii) කාෆි රාගයෙහි ගායන සාමය ලියා දක්වන්න.
(iii)භූපාලි රාගයේ වාදී සංවාදී ස්වර නම් කරන්න.
(iv) සුෂිර භාණ්ඩ වර්ගයට අයත් භාණ්ඩයක් නම් කරන්න.

**(v) සිට (viii) තෙක් ප්‍රශ්නවල දැක්වෙන ප්‍රකාශ වැරදිය. එම ප්‍රකාශ නිවැරදි කර ලියන්න.**

(v) කපිරිඤ්ඤා සංගීතය යනු පෘතුගීසින් හා ලන්දේසි ජනයා අතර ප්‍රචලිතව තිබූ ගීත සම්ප්‍රදායකි.
(vi) "එන්ඩද මැණිකේ මමත් දියඹටා" යන ගීතය ගායනා කර ඇත්තේ සුනිල් ශාන්ත ශූරීන්ය.
(vii) "පැහැසරණිය මිණි පැමිණිය කොත් අගට" පදය දොලොස්මත් විරිතට අයත් පදයකි.
(viii) විශ්ව නාත් ලව්ජි නාඩගම් සම්ප්‍රදාය සඳහා සංගීතය සැපයූ සංගීතඥයෙකි.

**(ix) සිට (xii) තෙක් ප්‍රශ්නවල හිස් තැන් පුරවන්න.**

(ix) ශුද්ධ රි, ග, ධ, නි සහ තීව්‍ර ම ස්වර විවාදී වන්නේ ...................... රාගයේදීය.
(x) ................ රාගය ඖඩුව ජාති රාගයකි.
(xi) බටහිර සංගීතයේ දී  සංකේතය හඳුන්වනුයේ ......................... නමිනි.
(xii) .................. යන සංගීත භාණ්ඩය ධ්වනි ගුණය, හැඩය, වාදනය කරන ස්වභාවය හඬ නිකුත්වන ආකාරය යන කරුණු සියල්ලෙන්ම දිල්රුබාව යන සංගීත භාණ්ඩයට සමානය.


(ලකුණු 12)

02.) පහත දැක්වෙනුයේ නිර්දේශිත රාග තුනකට අයත් ස්වර සංගතීන් කිහිපයකි.

(a) රි නි ධ නි ප ධ ම ප ගු රි
(b) ප ධ ස රි ග ,ප ග ,ධ ප ග රි ස
(c) නි ස ගු ම ප ධු ප

(i) ඉහත ස්වර සංගතීන් අයත් රාග නම් කරන්න. (ලකුණු 03)
(ii) (a) රාගයට අයත් මේලය ,ආරෝහණ - අවරෝහණ ,වාදී - සංවාදී ,මුඛ්‍යාංගය යන කරුණු 04 ලියන්න. (ලකුණු 04)
(iii) (b) හා (c) මගින් දැක්වෙන රාග දෙකෙන් එකකට අයත් මධ්‍යලය ගී යක ස්ථායි කොටස තානාලංකාර දෙකක් සමග ගීත ස්වර ප්‍රස්තාර කරන්න.(තානාලංකාර තාලානුකූලවම ලියන්න) (ලකුණු 05)

03.) (i) පෙරදිග භාණ්ඩ වර්ගීකරණයට අනුව වයලීනය හා සිතාරය අයත් වන්නේ කිනම් භාණ්ඩ වර්ගයකටද? (ලකුණු 01)
(ii) වයලීනය බටහිර ක්‍රමයට අනුව සුසර කරන ස්වර හතර නම් කරන්න. (ලකුණු 02)
(iii) රූප සටහනක් මගින් වයලිනයේ ශුද්ධ ස්වර සප්තකය පිහිටන ස්ථාන ලකුණු කරන්න.(ලකුණු 03)
(iv) උත්තර භාරතීය සංගීත භාණ්ඩයක් වන සිතාරය හඳුන්වාදුන් සංගීතඥයා කවරෙක්ද? (ලකුණු 01)




(v) ඉහත රූපයෙන් දැක්වෙන 1 සිට 8 දක්වා අංකනය කර ඇති ස්වර මොනවාද? (ලකුණු 04)
(vi) එම ස්වර පුවරුවේ 1+3+5 යන අංක වලින් දක්වා ඇති ස්වර අයත් වන chord එක නම් කරන්න. (ලකුණු 01)

04.) පහත සදහන් සංගීතඥයින් අතරින් ඔබ කැමැති සංගීතඥයින් දෙදෙනෙකු පිළිබදව පහත සදහන් මාතෘකා ඔස්සේ කරුණු ලියා දක්වන්න.

1.සී. ද .එස් කුලතිලක මයා
2. ඔබ්.බී මකුලොළුව මයා .
3.රෝහණ බැද්දගේ මයා.
4.සංගීතඥ ලුඩ්විග් වැන් බිතෝවන්
5. සංගීතඥ වුල්ෆ් ගැන්ග් අමදියස් මෝසාර්ට්

- ජීවන තොරතුරු
- සංගීත නිර්මාණ
- සංගීත ක්ෂේත්‍රයට හෝ අධ්‍යාපන ක්ෂේත්‍රයට සිදු වූ සේවය

(ලකුණු 2x6 =12)

05.)

| A | B |
|---|---|
| තානම | බෙරපදය |
| කවිය | තානම |
| කස්තිරම | කවිය |
| සීරුමාරුව | ඉරට්ටිය |
| අඩව්ව | |

i.ඉහත වගුවේ A සහ B තීරු දෙකෙන් කියැවෙන ජන සංගීත අංග දෙක නම් කරන්න. (ලකුණු 2)
ii.එම ජන සංගීත අංග දෙකට අයත් ගී පද දෙකක මුල් ගී පාදය බැගින් පද ප්‍රස්තාර කරන්න. (ලකුණු 4)

iii.ඉහත එක ගී පාදයකට අයත් ස්වර ප්‍රස්තාරය ලියා දක්වන්න. (ලකුණු 2)
iv.A හා B සංගීත අංග දෙක පිලිබදව සංසන්දනාත්මක කරුණු හතරක් ලියන්න. (ලකුණු 4)

06.) A - සෝබාව දේ මෙපුර සිරි විසිතුරු
B - රකිනු ඊශ්වරා
C - ගම්බිර කාලිංග නුවර

i. ඉහත A ,B හා C කොටස්වල දැක්වෙන ගී පාද අයත් රංග සම්ප්‍රදායන් තුන සහ නාට්‍ය තුන නම් කරන්න. (ලකුණු 6)
ii. B හා C ගීත අයත් වන ,රංග සම්ප්‍රදායන් දෙකට අදාළ වන සංගීතමය ලක්ෂණ තුනක් බැගින් වෙන් වෙන්ව ලියන්න. (ලකුණු3)
iii.ඉහත සම්ප්‍රදායන් තුනට අයත් වෙනත් ගීත තුනක් නම් කර ඒ එක් එක් ගීතය අයත් නාට්‍ය නම් කරන්න.


(ලකුණු 3)

07.)i. බටහිර සංගීත ප්‍රස්තාරකරණයේදී පහත නම් වලින් හැඳින්වෙන සංකේත ලියා දක්වන්න

(අ) සෙමිබ්‍රිව් (semi breve)
(ආ) මිනිම් (Minim)
(ඇ) ක්‍රොචට් (crotchet)
(ඇ) ක්වේවර් (quaver)

(ලකුණු 4)

ii. පහත දැක්වෙන ප්‍රස්තාර කොටස පෙරදිග ක්‍රමයට පෙරලා ප්‍රස්තාර කරන්න.



(ලකුණු 8)

The National e-learning Portal for The General Education